කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව
ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී උපාධි අවසාන වාර පරීක්ෂණය (ආර්ථික විද්‍යාව) - දෙවන වසර - 2018

පාඨමාලා ඒකක ක්‍රමය - දෙවන සෙමෙස්තරය

**ECN 2228 / ENH 2216- ලෝක ආර්ථිකය**

කාලය: පැ දෙකක් පමණයි

**ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න. සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු හිමි වේ.**

---

1. "දෙවන සහශ්‍රය නිමාවට පත් වූ 20 වන ශත වර්ෂයේදී ලෝක ආර්ථිකයෙහි සැලකිය යුතු වෙනස්කම් සනිටුහන් කරමින් සමාජ, ආර්ථික හා දේශපාලන සිද්ධීන් මාලාවක් සිදු විය".

    i. විසිවන සියවසේ ප්‍රධාන ආර්ථික වෙනස්කම් මොනවාද?
    ii. මෙම ශත වර්ෂයේදී ලෝක ආර්ථික සිතියමේ හැඩය වෙනස් කිරීමට දේශපාලනික සාධක කොතෙක් තීරණාත්මක වීද?
    iii. මෙම සියවස තුළ ශ්‍රී ලංකාව මුහුණ දුන් ප්‍රධාන ආර්ථික වෙනස්කම් මොනවාද?

2. "ලෝකය තුළ බොහෝ ආර්ථික ගැටලු සඳහා මූලික හේතුව වී ඇත්තේ වංචා සහ දූෂණ බව පෙනී යයි".

    i. වංචා සහ දූෂණ මගින් නිර්මාණය කරන ලද ප්‍රධාන ආර්ථික ගැටලු මොනවාද?
    ii. පසුගිය කාලය තුළ පිරිසිදු පාලන තන්ත්‍රයන් යහපත් ආර්ථික ප්‍රතිඵල ලබා දීමට සමර්ථ වී තිබේද?
    iii. ලෝකය තුළ වංචා සහ දූෂණ අඩු කිරීමට ඔබ යෝජනා කරන්නේ මොනවාද?

3. "අනෙකුත් විකල්ප අර්ථ ක්‍රම සමඟ සාපේක්ෂව බලන කල්හි පසුගිය වකවානුවෙහි වෙළඳපොළ ආර්ථිකයන් බොහෝ සංවර්ධන අංශයන්හිදී සාර්ථකව ක්‍රියාත්මක වී ඇත".

    i. ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? ඔබේ පිළිතුර සඳහා හේතු දක්වන්න.
    ii. 1990 දශකයේ මුල් අවධියේ සිට වෙළඳපොළ අර්ථ ක්‍රමවල කාර්යසාධනය ඔබ පරීක්ෂා කරන්නේ කෙසේද?
    iii. වෙළඳපොළ යාන්ත්‍රණය මගින් ලබා දුන් ඉඩ ප්‍රස්තාවන්ගෙන් ඉහළම ප්‍රතිඵල ලබා ගැනීමට ශ්‍රී ලංකාව කොතෙක් සමර්ථ වී තිබේද?

4. "ජාතියක ආර්ථික සෞභාග්‍ය ළඟා කර ගැනීම සඳහා නොකැඩුණු ආර්ථික වෘද්ධිය ප්‍රධාන වේ".

i. ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? ඔබේ පිළිතුර සඳහා හේතු දක්වන්න.
ii. චීනය හෝ ඉන්දියාවේ නොකැඩුණු වෘද්ධිය පසුපස පවත්නා වූ ප්‍රධාන සාධක හඳුනා ගන්න.
iii. ශ්‍රී ලංකාවේ මෑත කාලීන ආර්ථික වෘද්ධි කාර්යසාධනය ඔබ පරීක්ෂා කරන්නේ කෙසේද?

5. "එක මං තීරුවක් සහ එක පාරක් (One Belt One Road) පිටුපස පවත්නා වූ දර්ශනය වන්නේ, ආර්ථික සහයෝගිතාව, වෙළඳාම සහ මූල්‍ය සහයෝගිතාව, සමාජ සහ සංස්කෘතික සහයෝගීතාව සඳහා ලොව විශාලතම වේදිකාව නිර්මාණය කිරීමයි".

i. එක මං තීරුවක් සහ එක පාරක් සඳහා වූ පසුබිම කෙටියෙන් හඳුන්වන්න.
ii. එක මං තීරුවක් සහ එක පාරක් හී ගෝලීය ආර්ථික ප්‍රතිවිපාක කවරේද?
iii. එක මං තීරුවක් සහ එක පාරක් මගින් ලබා දෙන්නා වූ ඉඩ ප්‍රස්ථාවන්ගෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට ශ්‍රී ලංකාව සූදානමින් සිටීද?

6. "රටක ආර්ථික වෘද්ධිය සහ සංවර්ධනය හැඩ ගැසීමේදී බලශක්ති පරිභෝජන මට්ටම වැදගත් භූමිකාවක් ඉටු කරයි".

i. ඔබ ගෝලීය බලශක්ති පරිභෝජනයේ පරිණාමය විමසා බලන්නේ කෙසේද?
ii. ගෝලීය බොරතෙල් ඉල්ලුම සඳහා දායක වන ප්‍රධාන සාධකයන් කෙටියෙන් හඳුන්වන්න.
iii. බොරතෙල් මිල පහත වැටීමේ ධනාත්මක සහ සෘණාත්මක ප්‍රතිවිපාක කවරේද?

7. "1944 දී ලෝක රාජ්‍යයන් විසින් බ්‍රෙට්න් වුඩ්ස් සම්මුතිය අනුමත කිරීමේ සිට, ගෝලීය ආර්ථිකයේ ප්‍රධාන මුදල බවට ඇමරිකා එක්සත් ජනපද ඩොලරය පත්ව තිබේ".

i. බ්‍රෙට්න් වුඩ්ස් හීදී ලෝක සංචිත මුදල ලෙස එක්සත් ජනපද ඩොලරය නම් කරන ලද්දේ මන්ද?
ii. වර්තමානය වන විට එක්සත් ජනපද ඩොලරය මුහුණ දෙන ප්‍රධාන අභියෝග මොනවාද?
iii. විශේෂ ගැනුම් හිමිකම (SDR), එක්සත් ජනපද ඩොලරයට හොඳ විකල්පයක් යැයි ඔබ සිතනවාද?

8. පහත සඳහන් ඒවායින් ඕනෑම තුනක් **(03)** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. ධනවාදය හා සමාජවාදය
ii. දෘඪ සහ මෘදු මුදල්
iii. ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
iv. සංවර්ධනය සහ සංවර්ධනය වෙමින් පවතින රටවල්
v. ඉන්දියාව සහ දකුණු ආසියාව

------0------